**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය, දෙවන සෙමෙස්තරය – 2023/2024**

**SOC 1202 – මනෝවිද්‍යාවේ මූලධර්ම**

කාලය: පැ. දෙකයි (02)
ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. මනෝවිද්‍යාව, මානව චර්යාව සහ මානසික ක්‍රියාවලීන් අධ්‍යයනය කෙරෙන විද්‍යාව ලෙස නිර්වචනය කෙරේ. උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

2. සමීක්ෂණයක් (survey) යනු කුමක්ද? මනෝවිද්‍යාත්මක පර්යේෂණවලදී සමීක්ෂණයක් සිදු කිරීමේ අරමුණු මොනවාද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

3. මානව චර්යාව අධ්‍යයනය කිරීම සඳහා මනෝවිද්‍යාඥයින් නිරීක්ෂණ ක්‍රමය (observation method) භාවිත කරන්නේ ඇයි? උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

4. ඒබ්‍රහම් මැස්ලෝගේ අවශ්‍යතා ධුරාවලිය පිළිබඳ න්‍යායෙන් තර්ක කෙරෙන්නේ ඉහළ මට්ටමේ අවශ්‍යතා සපුරා ගැනීමට නම් පහළ මට්ටමේ අවශ්‍යතා සපුරාගත යුතු බවයි. විවේචනාත්මකව විභාග කරන්න.

5. "පුද්ගලයන් ඔවුන්ගේ චිත්තවේග ප්‍රකාශ කරනු ලබන්නේ කෙසේද යන්න කෙරෙහි සංස්කෘතිය බලපෑම් කරයි". සුදුසු උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

6. චිත්තවේග පිළිබඳ ජේම්ස්-ලැන්ජ්ගේ සහ කැනන් බාර්ඩ්ගේ න්‍යායන් අතර සමානකම් සහ වෙනස්කම් මොනවාද? නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

7. සම්භාව්‍ය තත්ත්වාරෝපණය (classical conditioning) සහ ක්‍රියාකාරී තත්ත්වාරෝපණය (operant conditioning) අතර වෙනස්කම් එදිනෙදා ජීවිතයෙන් උදාහරණ ගෙනහැර දක්වමින් පැහැදිලි කරන්න.

8. ස්මෘතිය ප්‍රජානන කෘත්‍යයක් (cognitive function) ලෙස සැලකෙන්නේ ඇයි? ස්මෘතියෙහි ක්‍රියාකාරිත්වය ඇසුරින් පැහැදිලි කරන්න.

***************************